## (4) 1989 අංක 06 දරන දකුණු පළාත් සභාවේ පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීම) ප්‍රඥප්තිය.

දකුණු පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ට වැටුප් හා දීමනා නියම කරනු ලැබීමට අදාළ ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. ප්‍රඥප්තිය 1989 අංක 06 දරන (පළාත් සභා වැටුප් සහ දීමනා) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

2. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සහ ඉන් පසුව , දකුණු පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට සහ සාමාජිකයන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා
(අ) දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මාසික වැටුප සහ දීමනාව වශයෙන් රුපියල් හාරදහසක් (රු.4,000/=) ද,

(ආ) දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ මාසික වැටුප සහ දීමනාව වශයෙන් රුපියල් තුන්දහසක් (රු. 3,000/=) ද, ගෙවිය යුත්තේය.

(ඉහත සඳහන් (අ) සහ (ආ) ඡේද යටතේ සියළු වැටුප් සහ දීමනා ගෙවීම පත්කරනු ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක විය යුත්තේය.

3. මෙම ප්‍රඥප්තිය යටතේ දකුණු පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට සහ සාමාජිකයන්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා දකුණු පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය. වැටුප් සහ දීමනා ගෙවීම දකුණු පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය